# මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අ.පො.ස (උ.පෙළ) 2020 ප්‍රතිඵල ඉහළ නැංවීමේ කඩිනම් ව්‍යාපෘතිය

## ඒකක පරික්ෂණ වැඩසටහන

**ව්‍යාපාර අධ්‍යයනය - නිපුණතාව 01**

**(1.කොටස) කාලය පැය 01 යි**

**ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

**01.**මිනිසා විසින් අනිවාර්යයෙන්ම සපුරා ගත යුතු කායික හා මානසික තත්ත්ව............................ වන අතර ඒවා සපුරා ගන්නා විවිධ ආකාර.......................වේ

**02.**ස්වයංපෝෂිත අර්ථක්‍රමය තුළ තමාට අවශ්‍ය දෑ තමාම නිෂ්පාදනය කිරීම..................... ලෙස හදුන්වන අතර අතිරික්ත නිෂ්පාදන වෙනත් පාර්ශ්ව සමග හුවමාරු කිරීම තුළින්.................... බිහි විය.

**03.**අන්තර්ජාලය හරහා මිලදී ගැනීමේ හා විකිණීමේ කටයුතු කිරීම.................වන අතර ව්‍යාපාරවලට අදාළ සියලුම කාර්යයන් අන්තර්ජාලය හරහා සිදු කිරීම..............වේ.

**04.**තරගකරුවන් ,සැපයුම්කරුවන්.................... පරිසර සාධක වන අතර අයිතිකරුවන්,සේවකයින්.....................පරිසර සාධකවලට අයත් වේ.

**05.**ව්‍යාපාරයක ශක්තීන් හා දුර්වලතා හඳුනාගත හැක්කේ .........................පරිසරය අධ්‍යයනය කිරීමෙන් වන අතර ව්‍යාපාරයක බාහිර පරිසරය අධ්‍යයනය කිරීමෙන්................. හා.......................හඳුනා ගත හැකි ය.

**ප්‍රශ්න අංක 05 සිට 10 තෙක් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සපයන්න**

**06.ව්‍යාපාරයක දැකිය හැකි ගතිලක්ෂණ 4ක් නම්කරන්න.**

**07. ව්‍යාපාරයක පැවතිය හැකි අරමුණු 4ක් සදහන් කරන්න.**

**08.ව්‍යාපාර ක්‍රියාවලියට අයත් කාර්යය 4ක් දක්වන්න.**

**09.වර්තමානයේ තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමග ව්‍යාපාර ක්ෂේත්‍රයේ සිදුවි ඇති ප්‍රවණතා 4 ක් නම් කරන්න.**

**10.ව්‍යාපාර වර්ගීකරණ පදනම් 4ක් සදහන් කරන්න.**

**(එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් 02x10= 20)**

**(11.කොටස )**

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**01.1.අවශ්‍යතා සෑම පුද්ගලයෙකුටම පොදු වුව ද වුවමනා එකිනෙකාට විවිධ වේ. අවශ්‍යතා හා වුවමනා සදහා නිදසුන් දක්වමින් මෙය පැහැදිළි කරන්න. ලකුණු 4**

**11.(අ) ව්‍යාපාර ක්‍රියාවලිය යෙදවුම් නිමවුම් ක්‍රියාවලියක් ලෙස රූපසටහනකින් ඉදිරිපත් කරන්න.
ලකුණු 2**

**(ආ) ඔබ ඉදිරිපත් කළ ව්‍යාපාර කාර්යයන් 02 ක් කෙටියෙන් පැහැදිලි කරන්න ලකුණු 2**

**111.සෘජු නිෂ්පාදනය .වෙළදාම හා වක්‍ර නිෂ්පාදනය අතර පවතින සම්බන්ධතාව පැහැදිලි කරන්න.
ලකුණු 2**

02.1.(අ).ඔබ ප්‍රදේශයේ පවතින ආපනශාලාවකට අදාළ අසල්වැසි පාර්ශ්ව 4 ක් නම් කරන්න.
ලකුණු 2

(ආ).ව්‍යාපාරය එම පාර්ශ්ව කෙරෙහි සැලකිළිමත් වීමට හේතු කෙටියෙන් පැහැදිලි කරන්න. .
ලකුණු 2

11.(අ)ව්‍යාපාර පරිරය අභ්‍යන්තර හා බාහිර වශයෙන් වර්ග කළ හැකිය. අභ්‍යන්තර හා බාහිර පරිසරය අධ්‍යයනයෙන් ව්‍යාපාරයකට ලැබෙන ප්‍රතිලාභ 2ක් නම් කරන්න.
ලකුණු 2

(ආ) ගෝලිය පරිසරයේ වෙනස්කම් ආර්ථික පරිසරය හා සම්බන්ධ වේ. නිදසුන් සහිතව පැහැදිලි කරන්න.
ලකුණු 4

නිතිපතා සෞඛ්‍ය පුරුදු අනුගමනය කරන්න.

2020 අ.පො.ස( උ.පෙළ) විභාගයට පෙනීසිටින ඔබ ට උසස් ප්‍රථිඵල ලැබීමටත් සරසවි වරම් හිමිවීමටත් සුබ පතමු. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා ඇතුලු සියලුම කාර්ය මණ්ඩලය. ඔබට ජයවේවා.....................................!!!!!!!!